දුරකථන / தொலைபேசி / Telephone ) 2698475 ) 2698490 ) 2698507

ෆැක්ස් / பெக்ஸ் / Fax ) 2692913 ) 2693869 )

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk


සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය / எனது இல / My No. ) Nccp/GoSL/01/2021

ඔබේ අංකය / உமது இல / Your No. : )

දිනය / திகதி / Date ) 16.01.2021

---

චක්‍ර ලේඛ අංක : 01-01/2021

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ආයතන ප්‍රධානී,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

## 'ලෝක පිළිකා දිනය' – 2021 පෙබරවාරි 04

වර්තමාන ගෝලීය පිළිකා උවදුර බරපතල මට්ටමක පවතින අතර එය ඉදිරි වසර කීපයේදී ඉහල යාමට නියමිතය.වසර 2020 දී ලොව පුරා නව පිළිකා රෝගීන් මිලියන 19.3ක් අළුතින් හදුනා ගන්නා ලදි. මෙම කාලය තුල ලොව මිලියන 10ක් පිළිකා නිසා මිය ගිය බව අනුමාන කරනලදි. ඊලඟ වසර විස්ස තුලදී ලොව පිළිකා රෝගීන් ගණන මිලියන 28.5 දක්වා ඉහල යනු ඇතැයි අපේක්ෂිතය.මෙම උවදුර මැඩලීම සදහා පිළිකාව පිළිබදව සහ එය පාලනය කිරීමේ ප්‍රායෝගික උපායමාර්ග සකස් කිරීම පිළිබදව දැනුමවත් බව වැඩි කිරීම අවශ්‍යවේ.

ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් ප්‍රකාශයට පත් කරන පිළිකා ආවේක්ෂණ දත්ත වාර්ථාවට අනුව ශ්‍රී ලංකාව තුල 2014 වසරේ නව පිළිකා රෝගීන් 23,105 ක් හදුනා ගැනුණි. මෙය පිළිවෙලින් ජනගහනය 100,000 කට දළ අනුපාතිකය 114.34 ක් ද, වයස ප්‍රාමාණිකෘත අනුපාතය (Age Standardized Incidence Rate) 98.1 ක්ද වේ. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව පසුගිය වසර කිහිපය මුළුල්ලේම ශ්‍රී ලංකාවේ සිදුවන මරණ වලින් පිළිකා රෝග හේතුවෙන් සිදුවන මරණ දෙවන ස්ථානය ගනී.

පිළිකා රෝගය හේතුවෙන් සෑම පුද්ගලයෙක්ම දුප්පත් පොහොසත් භේදයකින් තොරව කුමන අයුරකින් හෝ පීඩාවට පත් විය හැක. එමෙන්ම පිළිකා රෝගය හේතුවෙන් පුද්ගල මට්ටමෙන්, පවුල් මට්ටමෙන් හා ප්‍රජා මට්ටමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රථිපල අවම කිරීම සඳහා කටයුතු කිරීමේ හැකියාවක් සියලු දෙනාම සතුව ඇත.

සෑම වසරකම පෙබරවාරි 04 වන දිනය ලෝක පිළිකා දිනය ලෙස නම් කර සියලු දෙනා තුලම පිළිකා පිළිබදව විශේෂ අවධානයක් යොමු කිරීමට පියවර ගෙන ඇත. එහි අරමුණ වන්නේ වලක්වා ගත හැකි පිළිකා හේතුවෙන් මියයන මිලියන ගණනක් ජීවිත සුරැකීමට රාජ්‍ය මට්ටමෙන් මෙන්ම පුද්ගල මට්ටමෙන්ද ක්‍රියාත්මක වී දැනුවත් කිරීමේ වැඩසටහන් ද ඇතුළුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වේ. 2019 වසරේ සිට 2021 වසර දක්වා වන වසර 3 සඳහා ලෝක පිළිකා දිනයේ තේමාව වන්නේ **"මම, අපි වෙනුවෙන් අද මෙන්ම හෙටත්" ("I am and I will")** යන්නයි. ලෝක පිළිකා දිනය සැමරීම සඳහා ධනාත්මකව හා සැලසුම් සහගතව වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙන් පිළිකාව ජය ගැනීමට ක්‍රියා කල යුතුවේ. පිළිකා වැලැක්වීමට පියවර ගැනීම වැදගත් වන්නේ

- පිළිකා හේතුවෙන් බොහෝ දෙනෙක් තම ජීවිත කාලය තුල සෘජුව හෝ වක්‍රාකාරව පීඩනයට පත් වේ.

- පිළිකා නිසා සිදුවිය හැකි ව්‍යසනය අවම කොට නිසි කලට පෙර සිදුවන මරණ බොහොමයක් වලක්වා ගත හැක. පුද්ගල මට්ටමෙන්, ප්‍රජා මට්ටමෙන් හා රාජ්‍ය මට්ටමෙන් ක්‍රියාත්මක කරන වැඩ සටහන් බොහෝ සෙයින් මෙයට දායක විය හැක.
- ලොව පුරා සිදුවන මරණ වලට පිළිකා ප්‍රධාන හේතුවක් වන නමුත් එම මරණ වලින් 1/3 ක් පමණ වලක්වා ගත හැකිය. කලින් හඳුනාගත හොත් බොහෝ පිළිකා සම්පූර්ණයෙන් සුව කිරීමටද හැකියාවක් ඇත.
- පිළිකා වැලැක්වීමට හා ප්‍රතිකාර පහසුකම් වැඩි දියුණු කිරීමෙන්, ලොව පුරා වසරකට පිළිකා හේතුවෙන් මිලියන ගණනක් මිය යාම අඩු කරගත හැකිය.

ලෝක පිළිකා දිනය 2021 සැමරීම සඳහා සිදු කරන ක්‍රියාකාරකම් වලදී පහත දක්වා ඇති අරමුණු පිළිබඳවද අවධානය යොමු කල යුතුවේ.

1. ජීවන රටාව හා පිළිකා හටගැනීම, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් අනුගමනය කිරීමේ වැදගත්කම, පිළිකා සම්බන්දව තිබෙන වැරදි අදහස් හා පිළිකා වලින් තුනෙන් එකක් වලක්වාගත හැකි බව වැඩසටහන් මගින් ප්‍රජාව දැනුවත් කල යුතුය.

2. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙනත් රජයේ සහ පෞද්ගලික ආයතන වල කාර්ය මණ්ඩල ඉලක්ක කර ගනිමින් දේශන සහ සේවාස්ථ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. උදා:පාසල් ගුරුවරුන්,කර්මාන්ත ශාලා සේවකයන්. මෙහිදී ප්‍රාථමික සෞඛ්‍ය මට්ටමේදී පිළිකා වලක්වා ගැනීම, කලින් හඳුනා ගැනීම, පුනරුත්ථාපනය සහ සහන සත්කාර සේවා පිළිබඳ දැනුවත් කල යුතුය. මෙම සඳහා දැණුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කල යුතුය.

3. සෞඛ්‍ය සම්පන්න ආහාර ගනීම, ව්‍යායාම කිරීම, දුම්පානයෙන් වැලකීම වැනි යහපත් සාධක සහිත ජීවන රටාවක් ප්‍රගුණ කිරීම සඳහා රාජකාරි ස්ථාන ඇතුළු සියළු ආයතන උනන්දු කල යුතුය.

4. රෝග ලක්ෂණ කලින් හඳුනාගෙන නිසි ප්‍රතිකාර ලබා ගැනීම සහ එමගින් ආයු කාලය වැඩිකර ගත හැකිවීම පිළිබඳ සියළු දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී අවදානය යොමු කල යුතුය.පිළිකා රෝගීන් සහ ඉන් මිදුනු පුද්ගලයන් ඉලක්ක කර ආයතනික වශයෙන් ප්‍රජා මූල සහන සත්කාර සේවා ප්‍රවර්දනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සංවිදානය කිරීම.

5. පිළිකා රෝගයේ මුල් අවස්ථාවේදී හඳුනා ගැනීමෙන් හා හැකි ඉක්මනින් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමෙන් රෝගීන්ගේ ජීවත්වීමේ හැකියාව වැඩිවේ. මේ සම්බන්දයෙන් සෑම සෑම දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් වල අඩංගු විය යුතුය.

***මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී දැනට පවතින COVID 19 අවදානම සැලකිල්ලට ගනිමින් අළුතින් පනවන ලද සෞඛ්‍ය මාරගොපදේශ අනුගමනය කිරීම ඉතා වැදගත් වේ.**

ලෝක පිළිකා දිනය සැමරීම සඳහා සංවිධානය කර ඇති වැඩ් සටහන් වලදී ජාතික පිළිකා මර්දන වැඩ සටහන මඟින් ප්‍රකාශයට පත්කර ඇති පත්‍රිකා, අත් පොත් හා වෙනත් සෞඛ්‍ය අධ්‍යාපන මෙවලම් භාවිතා කල හැකිවේ. '2021 ලෝක පිළිකා දිනය' පෙබරවාරි මස, 04 වෙනිදට යෙදී ඇති බැවින් එදිනට සමගාමීව සිදු කරන වැඩසටහන් එදිනට ආසන්න දින/දිනයක් යොදා ගෙන සිදු කල හැක. දිස්ත්‍රික් මට්ටමෙන් සිදු කරන වැඩසටහන්, වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග, වෛද්‍ය නිලධාරී /මාතෘ හා ළමා සෞඛ්‍ය සහ දිස්ත්‍රික් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් සම්බන්ධීකරණය කල යුතු අතර ආයතන ප්‍රධානීන් - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, තම ආයතනය/ බල ප්‍රදේශය තුල ලෝක පිළිකා දිනය 2021 සැමරීම පිණිස අවම වශයෙන් එක් විශේෂ වැඩසටහනක් හෝ සිදු කිරීමට කටයුතු කරන මෙන් දන්වමි.

මෙම වැඩසටහන් නිසි පරිදි නිම කිරීමෙන් අනතුරුව පෙබරවාරි මස අවසානයේ ලෝක පිළිකා දිනය සැමරීම සඳහා විශේෂයෙන් සිදු කරන ලද කාර්යයන් ඇතුලත් සංක්ෂිප්ත වාර්තාවක් අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත එවීමට කටයුතු කරන ලෙසද දන්වමි. තවද, 2021 ලෝක පිළිකා දිනය සැමරීම සඳහා සිදු කරන වැඩ සටහන්වලදී ඔබගේ සක්‍රිය දායකත්වය හා මග පෙන්වීම අපේක්ෂා කරන අතර එය ඉතා අගය කොට සලකමි. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබ ආයතනයේ අදාල සියලු කාර්ය මණ්ඩල වල දැන ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද දන්වමි.

මෙ පිළිබඳව වැඩි දුර විස්තර සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂවරිය දුරකථන අංක: **0112368627** හෝ ඊමේල් **director.nccpsl@gmail.com** හරහා අමතන්න.

වෛද්‍ය. අසේල ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

1. ගරු අමාත්‍ය, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
2. ගරු නියෝජ්‍ය අමාත්‍ය, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
3. ගරු පළාත් සෞඛ්‍ය අමාත්‍ය
4. ලේකම්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
5. අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) - සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
6. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - බෝනොවන රෝග, වෛද්‍ය සේවා, මහජන සෞඛ්‍ය,
7. අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩසටහන
8. අධ්‍යක්ෂ - පවුල් සෞඛ්‍ය කාර්යාංශය
9. අධ්‍යක්ෂ - බෝ නොවන රෝග ඒකකය
10. අධ්‍යක්ෂ - සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
11. අධ්‍යක්ෂ - ප්‍රාථමික සෞඛ්‍ය සේවා
12. අධ්‍යක්ෂ - පෞද්ගලික සෞඛ්‍ය අංශ ප්‍රවර්ධන
13. අධ්‍යක්ෂ - ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය
14. අධ්‍යක්ෂ - වතු හා නාගරික සෞඛ්‍ය